# අයවැය පොරොන්දු: මැති සබයෙන් ඔබ්බට

2018 වසර අවසානයේ තක්සේරුව

2021

© Verité Research

# පටුන


අයවැය පොරොන්දු: මැති සබයෙන් ඔබ්බට ........ 3

ඇගයීම් ක්‍රමවේදය ........ 3

1. වියදම් යෝජනා ........ 4

  1.1. විවෘතභාවය ඇගයීම ........ 4

  1.2. රජයේ ආයතනවල විවෘතභාවය ශ්‍රේණිගත කිරීම ........ 5

  **තොරතුරු ලබා ගැනීමේ පහසුව:** ........ 5

  1.3. ප්‍රගතිය මැනීම ........ 6

2. ප්‍රතිපත්ති යෝජනා ........ 7

  2.1. ප්‍රගතිය මැනීම ........ 7

3. ප්‍රගතිය, විවෘතභාවය සහ ශ්‍රේණිගත කිරීමේ තක්සේරු පිළිබඳ විස්තර. ........ 8

# අයවැය පොරොන්දු: මැති සබයෙන් ඔබ්බට

2017 වසරේ අරඹන ලද "අයවැය පොරොන්දු: මැති සබයෙන් ඔබ්බට" වාර්ෂිකව අයවැය කතාවෙහි සඳහන් පොරොන්දු ඉටුකිරීමෙහිලා රජයේ කාර්ය සාධනය වාර්තා කරන publicfinance.lk යටතේ ඇති ඩෑෂ්බෝර්ඩයක් වේ.

ආණ්ඩුව ඉදිරිපත් කරන වාර්ෂික අයවැය කතාවෙහි අයවැය පොරොන්දු පිළිබඳ මූලික ප්‍රශ්න දෙකකට පිළිතුරු සෙවීම මෙම ඩෑෂ්බෝර්ඩය මූලික අරමුණ වේ.

- (i) රජය ක්‍රියාවට නංවන්නේ පවසන දෙය ද?
- (ii) රජය පවසන්නේ ක්‍රියාවට නංවන දෙය ද?

මෙම ඩෑෂ්බෝර්ඩය හරහා ඉහත ප්‍රශ්න වලට පිළිතුරු ජනතාවට ලබා දීමෙහි අරමුණ වන්නේ,

- (i) රජයේ අයවැය පොරොන්දු සම්බන්ධව විවෘතභාවය වර්ධනය කිරීම සහ
- (ii) අයවැය පොරොන්දු ඉටුකිරීම සම්බන්ධව රාජ්‍ය ආයතනවල වගවීම වර්ධනය කිරීමයි

# ඇගයීම් ක්‍රමවේදය

අයවැය කතාවේ සඳහන් රුපියල් මිලියන 500කට වඩා වැඩි නව වැය යෝජනා හෙවත් පොරොන්දු වෙනුවෙන් වෙන්කළ ප්‍රතිපාදනවල ප්‍රගතිය ඩෑෂ්බෝර්ඩය මගින් විමසා බැලේ. මෙම යෝජනා අයවැය ලේඛනයෙහි 2 වන ඇමුණුමෙහි සඳහන් වේ. 2019 දී මෙම ඩෑෂ්බෝර්ඩය ප්‍රතිපාදන වෙන් කිරීමක් නොමැති, නීති සහ රෙගුලාසි වල වෙනස්කම් වැනි ප්‍රතිපත්ති යෝජනා විමසා බැලීම ආරම්භ කරන ලදී.

| වසර | තෝරාගත් වියදම් යෝජනා | | | තෝරාගත් ප්‍රතිපත්ති යෝජනා |
|---|---|---|---|---|
| | තෝරා ගැනීමේ සීමාව[1] | යෝජනා ගණන | යෝජනා වල මුළු වටිනාකම | යෝජනා ගණන |
| 2017 | රු. බිලියන 1ට වැඩි | 37 | රු. මිලියන 116,910 | 0 |
| 2018 | රු. බිලියන 1ට වැඩි | 38 | රු. මිලියන 149,350 | 0 |
| 2019 | රු. මිලියන 500 ට වැඩි | 37 | රු. මිලියන 100,875 | 22 |

වසරකට දෙවතාවක් යාවත්කාලීන කරන මෙම වේදිකාව නව වියදම් විවෘතභාවය සහ ප්‍රගතිය යන දර්ශක දෙකක් යටතේ ඇගයීමට ලක් කරයි.ප්‍රතිපත්ති යෝජනා ක්‍රියාත්මක කිරීම තනි ප්‍රගති දර්ශකයක් භාවිතයෙන් නිරීක්ෂණය

[1] 2017 සහ 2018 දී තෝරා ගැනීමේ සීමාව පදනම් වූයේ යෝජනා සඳහා යෝජිත වියදම් වෙන් කිරීම මත පමණි. අයවැය කථාවේ වාර්තාකරණ ආකෘතියේ වෙනසක් හේතුවෙන් 2019 දී තෝරා ගැනීමේ සීමාව පදනම් වූයේ යෝජිත ප්‍රතිපාදන යෝජනාව සහ එයට දැනටමත් වෙන් කර ඇති මුදල එකතු කිරීම මත ය.

කරනු ලැබේ. ප්‍රතිපත්ති යෝජනා වල තත්වය ප්‍රධාන වශයෙන් ඇගයීමට ලක් කරනු ලැබුවේ ප්‍රසිද්ධියේ ලබා ගත හැකි තොරතුරු හරහා වන අතර තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ ගොනු කරන ලද ඉල්ලීම් මත රැඳී සිටීමෙන් නොවේ. එබැවින් ප්‍රතිපත්ති යෝජනා ඇගයීමට ලක් කිරීමේදී විවෘතභාවය පිළිබඳ දර්ශකයක් නොමැත.

ආණ්ඩුවේ අර්ධ වාර්ෂික කාර්ය සාධනය එම වසරේ ඔක්තොබර් මස තුළදීද, සමස්ථ වාර්ෂික කාර්ය සාධනය ඊළඟ වසරේ අප්‍රේල්/ මැයි මස තුළදීද එළි දක්වයි. [2]

# 1. වියදම් යෝජනා

## 1.1. විවෘතභාවය ඇගයීම

මෙම දර්ශකය, අයවැය යෝජනා සමබන්ධයෙන්, රජය පවසන්නේ ක්‍රියාවට නංවන දෙයද යන්න අධ්‍යයනය කෙරේ. මෙහි දී අගයීමට ලක් කරන්නේ අයවැය පොරොන්දු වල ප්‍රගතිය පිළිබඳ තොරතුරු කොපමණ දුරට රජය හෙළිදරව් කරන්නෙද යන්නයි. මේ සදහා අවශ්‍ය අයවැය පොරොන්දුවලට අදාළ තොරතුරු අදාළ රාජ්‍යය ආයතනයේ වෙබ් අඩවි පරීක්ෂා කිරීම සහ තොරතුරු දැනගැනීමේ පණත (RTI) යටතේ රාජ්‍යය ආයතන වෙත තොරතුරු ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීම මගින් රැස්කර ඇත. 2017 සහ 2018 වර්ෂවලදී රජයේ ආයතන වෙත ගොස් සහ එම ආයතන වෙත අවිධිමත් ඉල්ලීම් කර ද තොරතුරු රැස් කරන ලදී. කෙසේ වෙතත්, එම තොරතුරු රැස් කිරීමේ ක්‍රමය මේ වනවිට අත්හිටුවා ඇත.

අර්ධ වාර්ෂික ඇගයීමේදී, වසරේ පළමු මාස හය තුළ අයවැය පොරොන්දු ප්‍රගතිය සම්බන්ධයෙන් තොරතුරු හෙළි කිරීම අගයන අතර, වසර අවසානයේ ප්‍රගතිය සම්බන්ධයෙන් තොරතුරු හෙළි කිරීම සමස්ත වසර අවසානයේදී ඇගයීමට ලක් කරයි.

ඇගයීම කරන අවස්ථාවේ දී ලබා ගත හැකි තොරතුරු මත පදනම්ව විවෘතභාවය පහත පරිදි වර්ගීකරණය කර ඇත.

**ආවෘත-** සමස්ථ වසර තුල ප්‍රගතිය ඇගයීමට අවශ්‍ය කිසිදු තොරතුරක් නැත

**සීමිත-** තිබෙන තොරතුරු සමස්ථ වසර තුල ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නැත

**උදාසීන-** ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබාගැනීමට සහ/හෝ ලබා දුන් තොරතුරු භාවිතා කරමින් ප්‍රගතිය ඇගයීමට දැඩි පරිශ්‍රමයක් දැරීමට සිදුවිය

**සාධනීය-** අයවැය පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු අදාළ කාලය තුළ ඉල්ලුම් කිරීමෙන් ලබාගත හැකිය

**විවෘත-** පොරොන්දුවේ සමස්ථ ප්‍රගතිය පිළිබඳ තොරතුරු ප්‍රගාමීව හෙළිදරව් කර ඇත

[2] 2019 අයවැය කථාව ප්‍රමාද වී 2019 මාර්තු මාසයේදී පමණක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ බැවින් 2019 දී වසර අවසානයේ ඇගයීම පමණක් සිදු කරන ලදී.

## 1.2. රජයේ ආයතනවල විවෘතභාවය ශ්‍රේණිගත කිරීම


ඒ ඒ රාජ්‍ය ආයතනය තමන් ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින පොරොන්දු පිළබඳ තොරතුරු හෙළිදරව් කිරීම මත පදනම්ව එම ආයතනවල විවෘතභාවය පිළිබඳ සංසන්දනාත්මක ශ්‍රේණිගත කිරීමක් මෙමඟින් සපයයි. සෑම ආයතනයකටම 0 සිට 100 දක්වා ලකුණු ලැබෙනු ඇති අතර ඉහළම ලකුණු මට්ටම පෙන්නුම් කරන්නේ ලකුණු 100 කින්ය. අනතුරුව, වර්ෂය තුළ ඔවුන්ගේ සාපේක්ෂ ක්‍රියාකාරිත්වය පෙන්නුම් කරමින්, වැඩිම ලකුණු ගත් ආයතනයේ සිට අඩුම ලකුණු ගත ආයතනය දක්වා රාජ්‍ය ආයතන ඉහළ සිට පහළට ශ්‍රේණිගත කරනු ලැබේ.

රාජ්‍ය ආයතනය සඳහා වන සමස්ත ලකුණු ගණනය කරනු ලබන්නේ එම ආයතනයේ විෂය පථයට අයත් එක් එක් පොරොන්දුවේ ලකුණු වල බරිත සාමාන්‍යක් ලෙස ය. සෑම පොරොන්දුවක්ම 0 සිට 100 දක්වා පරාසයක් තුල ඇගයීමට ලක් කෙරේ. සෑම පොරොන්දුවක් සඳහාම ලකුණු ගණනය කරන (i) පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමේදී ලද තොරතුරු කොපමණ දුරට ප්‍රයෝජනවත්ද සහ (ii) කොතරම් පහසුවෙන් එම තොරතුරු ලබා ගත හැකි වූවාද යන කරුණු දෙක මත ය.

තොරතුරු භාවිතයට සුදුසු වීම/ භාවිතා කිරීමේ හැකියාව: ලබා ගත් තොරතුරු, සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගත හැකි, අර්ධ වශයෙන් ප්‍රයෝජනයට ගත හැකි සහ කිසිසේත්ම ප්‍රයජෝනයට ගත නොහැකි යනුවෙන් බාණ්ඩ තුනකට වර්ග කර, පිළිවෙලින් 100, 50 සහ 0 වශයෙන් ලකුණු ලබා දෙන ලදී.

### තොරතුරු ලබා ගැනීමේ පහසුව:

ලබාගත් තොරතුරු වල ප්‍රයෝජනවත්බව අනුව ලබා දුන් ලකුණු, එම තොරතුරු ලබා ගැනීමේ පහසුව අනුව නැවත සකස් කරනු ලැබේ. මෙහිදී තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉල්ලුම් කිරීමෙන් තොරතුරු ලබා ගැනීමේ හැකියාවට සාපේක්ෂව අන්තර්ජාලය හරහා ඉල්ලුම් කිරීමකින් තොරව තොරතුරු ලබා ගැනීමේ හැකියාවට වැඩි ලකුණු හිමි වෙයි.



## 1.3. ප්‍රගතිය මැනීම

මේ දර්ශකය යටතේ රජය තමන් සිදු කරන බව පැවසූ ක්‍රියාකාරකම් කෙතරම් දුරකට ඉටු කර ඇත්ද යන්න විමසා බැලේ. එනම් මෙහිදී පොරොන්දු ඉටු කිරීමේ ප්‍රගතිය ඇගයීමට ලක්කරයි. මෙම ඇගයීම කරන්නේ පොරොන්දුව ඉටුකිරීමට වගකිව යුතු රාජ්‍ය ආයතනය විසින්ම ප්‍රකාශයට පත් කරන ලද කාලසීමාවන් හා ඉලක්ක පදනම් කරගෙනය.

අයවැය පොරොන්දු වල *<u>අර්ධ වාර්ෂික ප්‍රගතිය</u>* පහත පරිදි වර්ගීකරණය කර ඇත.

**හෙළිකර නැත-** ප්‍රගතිය ඇගයීමට කිසිදු තොරතුරක් නැත. නැතහොත් පවත්නා තොරතුරු ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නැත

**අතහැර දමා ඇත-** මෙම පොරොන්දුව තක්සේරු කිරීමේ වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර නොමැත

**නොසලකා හැර ඇත-** මෙම පොරොන්දුව ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇතත් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර නැත

**මන්දගාමී ප්‍රගතියක් ඇත-** මෙම පොරොන්දුව ක්‍රියාවට නංවා ඇතිමුත් නියමිත කාලයට කටයුතු සිදු කිරීමට අසමත් වී ඇත

**සතුටුදායක ප්‍රගතියක් ඇත-** මෙම පොරොන්දුව ක්‍රියාවට නංවා ඇති අතර අදාළ ඉලක්කය අත්පත් කරගෙන හෝ ඉලක්කය අභිබවා ගොස් ඇත[3]

අයවැය පොරොන්දු වල *<u>වාර්ෂික ප්‍රගතිය</u>* පහත පරිදි වර්ගීකරණය කර ඇත.

**හෙළිකර නැත-** ප්‍රගතිය ඇගයීමට කිසිදු තොරතුරක් නැත. නැතහොත් පවත්නා තොරතුරු ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නැත/ ප්‍රයෝජනයට ගත නොහැක.

**අතහැර දමා ඇත-** වසරේ ක්‍රියාකාරී සැලසුමෙන් ඉවත්කර හෝ වසර තුල කිසිදු ප්‍රගතියක් වාර්තා කර නොමැත

**දුර්වලයි-** ඉලක්කගත ප්‍රගතියෙන් 33% වඩා අඩු ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

---

[3] අයවැය පොරොන්දුවක් සතුටුදායක ප්‍රගතියක් ලබාඇති බවට වර්ගීකරණය කෙරෙනුයේ ජුනි 30වන දින වන විට අයවැය වර්ෂයේ ඉලක්ක වලින් 90% ක් වත් අදාළ කාලය තුළ නිම කර ඇත්නම් පමණි.

**අර්ධසම්පූර්ණයි-** ඉලක්කගත ප්‍රගතියෙන් 33%-66% අතර ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

**සැළකිය යුතුයි-** ඉලක්කගත ප්‍රගතියෙන් 66%-80% ත් අතර ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

**සම්පූර්ණයි-** ඉලක්කගත ප්‍රගතියෙන් 80% ඉක්මවූ ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත

# 2. ප්‍රතිපත්ති යෝජනා

2019 දී BudgetPromises.Org විසින් අයවැය කථාවේදී රජය විසින් කරන ලද ප්‍රතිපත්තිමය කැපවීම්වල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා සිය විෂය පථය පුළුල් කළේය. මෙම යෝජනා සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමක් නොමැත.

ව්‍යවස්ථාදායක/ නීතිකාරක/ නීති සම්පාදක පැනවීමක් හෝ නියාමන දැනුම්දීම් (ගැසට්) "ක්‍රියාත්මක කර ඇත" හෝ "අර්ධ වශයෙන් ක්‍රියාත්මක කර ඇත" ලෙස සැලකීමට අවශ්‍යතාවය මත මෙම යෝජනා තෝරා ගන්නා ලදී. පොදුවේ ලබා ගත හැකි ගැසට් නිවේදන, රජයේ චක්‍රලේඛ, රජයේ තොරතුරු දෙපාර්තමේන්තුවේ කැබිනට් තීරණ පිළිබඳ නිවේදන වලින් තොරතුරු ලබා ගන්නා ලදී. ප්‍රතිපත්තිය පිළිබඳ පොදු තොරතුරු නොමැති විට, ලිපි, දුරකථන ඇමතුම් සහ විද්‍යුත් තැපැල් මගින් තොරතුරු සඳහා අමාත්‍යාංශයට සෘජුවම සම්බන්ධ විය.

## 2.1. ප්‍රගතිය මැනීම

අයවැය කථාවේ හඳුන්වා දී ඇති ප්‍රතිපත්ති යෝජනා ක්‍රියාත්මක කිරීමේදී රජය ලබා ඇති ප්‍රගතිය මෙමගින් විමසා බැලේ.

**හෙළිකර නැත-** ප්‍රගතිය ඇගයීමට කිසිදු තොරතුරක් නැත. නැතහොත් පවත්නා තොරතුරු ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නැත.

**ක්‍රියාත්මක කර නැත-** යෝජනාවේ කිසිදු කොටසක් සඳහා අවශ්‍ය ව්‍යවස්ථාදායක/ නීතිකාරක/ නීති සම්පාදක පැනවීමක් හෝ නියාමන දැනුම්දීම් (ගැසට්) ප්‍රකාශයට පත් කර නොමැත. අදාළ අමාත්‍යාංශය / රජයේ ආයතනය විසින් මෙය ලිඛිතව සනාථ කර ඇත.

**අර්ධ වශයෙන් ක්‍රියාත්මක කර ඇත-** යෝජනාවේ සියලුම කොටස් සඳහා නොව සමහර කොටස් සඳහා අවශ්‍ය ව්‍යවස්ථාදායක/ නීතිකාරක/ නීති සම්පාදක පැනවීමක් හෝ නියාමන දැනුම්දීම් (ගැසට්) ප්‍රකාශයට පත් කර ඇත.

**සම්පූර්ණව ක්‍රියාත්මක කර ඇත-** ප්‍රතිපත්ති යෝජනාව සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර ඇත. යෝජනාවේ සම්පූර්ණ විෂය පථය සඳහා අවශ්‍ය ව්‍යවස්ථාදායක/ නීතිකාරක/ නීති සම්පාදක පැනවීමක් හෝ නියාමන නිවේදනය (ගැසට් පත්‍රය) ප්‍රකාශයට පත් කර ඇති අතර වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවේ.

## 3. ප්‍රගතිය, විවෘතභාවය සහ ශ්‍රේණිගත කිරීමේ තක්සේරු පිළිබඳ විස්තර.

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| කෘෂි කර්මාන්තය, බිංදු ජල සම්පාදනය ඇතුලත් කෘෂි සැකසුම් කර්මාන්ත, කුකුළු පාලනය, ටින් කිරීම, වැවිලි කර්මාන්ත සහ හෝටල් කර්මාන්තයේ යෙදෙන සමාගම්හට තම විදුලිබල අවශ්‍යතාවය සපුරා ගැනීමට සූර්ය බලයෙන් විදුලි බලය නිෂ්පාදනය කිරීම සඳහා සහනදායී ණය යෝජනා ක්‍රමයක් | සාධනීය | අර්ධ සම්පූර්ණයි | මුදල් අමාත්‍යාංශය<br>(මීට පෙර මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය) |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. වගකිවයුතු රාජ්‍ය ආයතනයට කළ ඉල්ලීමක් මත ප්‍රගතියට අදාළ වැඩිදුර තොරතුරු විද්‍යුත් තැපැල හරහා ලබා ගැනිණි. | ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම් අටෙන් හතරක් පමණක් 2018 වසර තුළ ඉටු කර ඇත. එබැවින් මෙහි ප්‍රගතිය 50% ක් ලෙස තක්සේරු කර ඇත. | |
| අරුවක්කාලුහි කැලිකසළ ප්‍රතිචක්‍රීකරණ සහ කළමනාකරණ ප්‍රදේශයක් සංවර්ධනය කිරීම. | විවෘත | අර්ධ සම්පූර්ණයි | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු වගකිවයුතු රාජ්‍ය ආයතනයේ වෙබ් අඩවිය ඔස්සේ සපයා ඇති ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. මීට අමතරව 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනය වෙත ඉදිරිපත් කළ තොරතුරු ඉල්ලුම්පතකින් සහ විද්‍යුත් තැපැල හරහා කළ ඉල්ලීමක් මත ද තොරතුරු ලබා ගැනිණි. | ලද තොරතුරු අනුව, 2018 දෙසැම්බර් 31 වන දින වන විට 2018 වසර සඳහා ඉලක්ක ගත ප්‍රගතියෙන් 63% ක් අත්කරගෙන ඇත. | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| භූගත ජල සම්පත අධීක්ෂණයට සහය දීම. | සාධනීය | සම්පූර්ණයි | කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග හා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය<br>(මීට පෙර වාරිමාර්ග හා ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය) |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු වගකිවයුතු රාජ්‍ය ආයතනයට කළ ඉල්ලීමක් මත විද්‍යුත් තැපැල හරහා ලද ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. | ලද තොරතුරු අනුව, 2018 දෙසැම්බර් 31 වන දින වන විට 2018 සඳහා ඉලක්ක ගත ප්‍රගතියෙන් 93% ක් අත්කරගෙන ඇත. | |
| සෑම ප්‍රාදේශීය සභා කොට්ඨාශයකම රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වයක් ලෙස හරිත උයනක් ඉදිකිරීම. | විවෘත | අර්ධ සම්පූර්ණයි | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු වගකිවයුතු රාජ්‍ය ආයතනයේ වෙබ් අඩවිය ඔස්සේ සපයා ඇති ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. මීට අමතරව 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනය වෙත ඉදිරිපත් කළ තොරතුරු ඉල්ලුම්පතකින් සහ විද්‍යුත් තැපැල හරහා කළ ඉල්ලීමක් මත ද තොරතුරු ලබා ගැනිණි. | ලද තොරතුරු අනුව, 2018 දෙසැම්බර් 31 වන දින වන විට 2018 සඳහා ඉලක්ක ගත ප්‍රගතියෙන් 39% ක් අත්කරගෙන ඇත. මෙහි එක් එක් ක්‍රියාකාරකම සඳහා ප්‍රතිපාදන දී නොමැති බැවින් ප්‍රගතිය ගණනය කර ඇත්තේ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකරකම් වල ප්‍රගතිය එහි මුළු පිරිවැය සමඟ බර තැබීමෙනි. පොරොන්දුව යටතේ ඇති සියලු උප ක්‍රියාකාරකම්වල මුළු පිරිවැය 2018 දී පොරොන්දු වූ අයවැය ප්‍රතිපාදනය ඉක්මවා ඇත. | |
| නිල්වලා එළිය ආදර්ශ උද්‍යානය | විවෘත | දුර්වලයි | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු වගකිවයුතු රාජ්‍ය ආයතනයේ වෙබ් අඩවිය ඔස්සේ සපයා ඇති ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. මීට අමතරව 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනය වෙත ඉදිරිපත් කළ තොරතුරු ඉල්ලුම්පතකින් සහ විද්‍යුත් තැපැල හරහා කළ ඉල්ලීමක් මත ද තොරතුරු ලබා ගැනිණි. | ලද තොරතුරු අනුව, 2018 දෙසැම්බර් 31 වන දින වන විට 2018 සඳහා ඉලක්ක ගත ප්‍රගතියෙන් 10% ක් අත්කරගෙන ඇත. මෙහි සියලු ක්‍රියාකාරකම් වල ප්‍රතිපාදන වෙන වෙනම දී නොමැති බැවින් ප්‍රගතිය ගණනය කර ඇත්තේ සියලු ක්‍රියාකාරකම් අත්පත් කරගත් ප්‍රගතියේ සාමාන්‍යය ගණනය කිරීමෙනි. මෙම පොරොන්දුව යටතේ වූ ක්‍රියාකාරකම් හතරකින් දෙකක ප්‍රගතිය පිළිබඳ කිසිදු තොරතුරක් වාර්තා නොවන බැවින් ප්‍රගතිය 0% ලෙස උපකල්පනය කර ඇත. | |
| කලපු 10 ක් පවිත්‍ර කිරීම. | සාධනීය | අර්ධ සම්පූර්ණයි | කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග හා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය<br>(මීට පෙර ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය) |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. | ලද තොරතුරු අනුව, 2018 දෙසැම්බර් 31 වන දින වන විට 2018 සඳහා ඉලක්ක ගත ප්‍රගතියෙන් 45% ක් අත්කරගෙන ඇත. | |
| කුඩා සහ මධ්‍ය පරිමාණ වැව්වල රොන්මඩ ඉවත් කිරීම. | සාධනීය | සැළකිය යුතුයි | කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග හා ධීවර හා |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
| --- | --- | --- | --- |
| | | | ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය<br>(මීට පෙර කෘෂිකර්ම අමාත්‍යාංශය) |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු වගකිවයුතු රාජ්‍ය ආයතනයට කළ ඉල්ලීමක් මත විද්‍යුත් තැපැල හරහා ලද ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. | ලද තොරතුරු අනුව, 2018 දෙසැම්බර් 31 වන දින වන විට 2018 සඳහා ඉලක්ක ගත ප්‍රගතියෙන් 75% ක් අත්කරගෙන ඇත. මෙහි ප්‍රගතිය ගණනය කර ඇත්තේ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකරකම් වල ප්‍රගතිය එහි ප්‍රතිපාදන සමඟ බර තැබීමෙනි. තවමත් සිදුකරමින් පවතින ක්‍රියාකාරකම්වල ප්‍රගතිය 50% ලෙස උපකල්පනය කර ඇත. | |
| ගොවීන් සඳහා දායකත්ව රක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම. | සීමිත | සම්පූර්ණයි | කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග හා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය<br>(මීට පෙර කෘෂිකර්ම අමාත්‍යාංශය) |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු වගකිවයුතු රාජ්‍ය ආයතනයට කළ ඉල්ලීමක් මත විද්‍යුත් තැපැල හරහා ලද ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. කෙසේ වෙතත්, අර්ධ වාර්ෂික ඇගයීම සඳහා ලද ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ඉලක්ක හා ලද ප්‍රගති වාර්තාවේ සටහන් තොරතුරු සැසඳිය නොහැකි බැවින් එම තොරතුරු භාවිතයෙන් ප්‍රගතිය ඇගයිය නොහැකි විය. මෙම පොරොන්දුව සඳහා ප්‍රගතිය තීරණය කරන ලද්දේ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති තොරතුරු අනුව, 2018 සැප්තැම්බර් 30 දින වන විට 2018 සඳහා ඉලක්ක ගත ප්‍රගතියෙන් 100% ක් අත්කරගෙන ඇත. නමුත්, වගකිවයුතු රාජ්‍ය ආයතනයට කළ ඉල්ලීමක් මත විද්‍යුත් තැපැල හරහා ලද තොරතුරු අනුව 2018 වසර තුළ මෙම පොරොන්දුව සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදනයෙන් 22%ක් පමණක් භාණ්ඩාගාරයෙන් ලබා දී ඇත. එබැවින්, | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | "2018 සැප්තැම්බර් 30 දිනට මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් වල ප්‍රගතිය" යන වාර්තාව භාවිතයෙනි. | මුල් ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් බොහෝ ක්‍රියාකාරකම් ඉටුකිරීමට අරමුදල් ප්‍රමාණවත් වී නොමැත. | |
| ධීවර වරායවල්වල නැංගුරම්ලන ස්ථාන සංවර්ධනය සහ වැඩිදියුණු කිරීම. | සාධනීය | සම්පූර්ණයි | කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග හා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය<br><br>(මීට පෙර ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය) |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. | ලද තොරතුරු අනුව, 2018 දෙසැම්බර් 31 වන දින වන විට, 2018 සඳහා ඉලක්ක ගත ප්‍රගතියෙන් 87% ක් අත්කරගෙන ඇත. මෙහි ප්‍රගතිය ගණනය කර ඇත්තේ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකරකම් වල ප්‍රගතිය එහි ප්‍රතිපාදන සමඟ බර තැබීමෙනි. පෙර ක්‍රියාකාරී සැලැස්මවල් වලට අනුව (මේ වනවිට නැවත සංශෝධනය කර ඇති ) සවිස්තරාත්මක සැලසුම් අදියරේ ක්‍රියාකාරකම් 2% ක ප්‍රගතියක්ද, ප්‍රසම්පාදන අදියරේ ක්‍රියාකාරකම් 5% ක ප්‍රගතියක්ද අත්කරගෙන ඇති බව උපකල්පනය කර ඇත. | |
| සංවර්ධන බැංකුවක් ස්ථාපිත කිරීම. | සීමිත | හෙළිකර නැත | මුදල් අමාත්‍යාංශය<br><br>(ප්‍රථමයෙන් මෙය පැවරී තිබුණේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | | | කටයුතු අමාත්‍යාංශය වෙතය) |
| | වගකිවයුතු රජයේ ආයතනයට විද්‍යුත් තැපැල හරහා යොමුකළ තොරතුරු ඉල්ලීමකට පිළිතුරු ලෙස තොරතුරු ලැබුණ නමුත් එම තොරතුරු ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නොවේ. | පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට පවත්නා තොරතුරු ප්‍රමාණවත් නොවේ. | |
| ග්‍රාම ශක්ති සහ දිළිඳු බව තුරන් කිරීමේ වැඩසටහන | සීමිත | පෙළිකර නැත | ජනාධිපති ලේකම් කාර්යාලය |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු, 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. මීට අමතරව ජනාධිපති මාධ්‍ය අංශයේ වෙබ් අඩවිය මගින්ද ප්‍රගතියට අදාළ තොරතුරු ලබාගැණිනි. කෙසේ වෙතත් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ඉලක්ක හා ලද ප්‍රගති වාර්තාවේ සඳහන් තොරතුරුවල පවත්නා සැසඳිය නොහැකි බව හේතුවෙන් එම තොරතුරු භාවිතයෙන් ප්‍රගතිය ඇගයිය නොහැකි විය. | 2016 අංක 12 තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ වගකිව යුතු ආයතනයෙන් පොරොන්දුව අත්කරගත් ප්‍රගතිය පිළිබඳ විශාල තොරතුරු ප්‍රමාණයක් ලැබුණද, එක් එක් ක්‍රියාකාරකම එහි ඉලක්කයට සාපේක්ෂව අත්කරගත් ප්‍රගතිය ගණනය කළ නොහැක. | |
| මිල්ලනිය රොජානා කර්මාන්ත උද්‍යානය සඳහා යටිතල පහසුකම් ලබාදීම. | සාධනීය | අතහැර දමා ඇත | සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් අතර ක්‍රියාකාරී සැලැස්ම වගකිවයුතු රාජ්‍ය ආයතනයේ වෙබ් අඩවිය හරහා ලබාගැණිනි.මීට අමතරව, ප්‍රගතිය පිළිබඳ තවත් තොරතුරු ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 සැප්තැම්බර් 30 දිනට මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් වල ප්‍රගතිය" යන වාර්තාව හරහා ද ලබාගැණිනි. මෙහි ආයෝජන හවුල්කරු වන තායිලන්තයේ රොජානා ඉන්ඩස්ට්‍රීස් සමඟ එකඟතාවයකට | මෙම පොරොන්දුවේ කාර්‍ය්‍ය පරාසය වෙනස් වීම නිසා මෙම පොරොන්දුව අතහැර දමා ඇති පොරොන්දු ගණයෙහිලා සැලකේ. | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | පැමිණීමට නොහැකිවීම හේතුවෙන් මෙම පොරොන්දුව තුළින් ඉටුකිරීමට බලාපොරොත්තුවන කාර්‍යය පරාසය වෙනස් විය. එම නිසා මෙය අත්හැර දැමූ පොරොන්දුවක් ලෙස සැලකේ. | | |
| "රැකියා සඳහා සූදානම් කිරීමේ අරමුදල" ඇති කිරීම. | ආවෘත | හෙළිකර නැත | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන හා යෞවන කටයුතු අමාත්‍යාංශය<br><br>(මීට පෙර තරුණ කටයුතු, ව්‍යාපෘති කළමනාකරණ සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය) |
| | මෙම පොරොන්දුවට අදාළ තොරතුරු ලබාගැනීමට වගකිවයුතු රාජ්‍ය ආයතනය වෙත ලබාදුන් දුරකථන ඇමතුම් වලට සහ 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉදිරිපත් කළ තොරතුරු ඉල්ලීමට මෙම අදාළ රාජ්‍ය ආයතනය තොරතුරු ලබා නොදුන් අතර මෙම පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට භාවිත කළ හැකි කිසිදු තොරතුරක් වගකිවයුතු ආයතනයේ වෙබ් අඩවියේ පළකර නැත. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉදිරිපත් කළ තොරතුරු ඉල්ලීමට පිළිතුරු ලෙස, වගකිව යුතු රාජ්‍ය ආයතනය ලිපියක් යොමු කරමින්, 'තරුණ කටයුතු, ව්‍යාපෘති කලමනාකරණ හා දක්ෂිණ සංවර්ධන' යන කටයුතු එම ආයතනය යටතට අයත් නොවන බවත්, ඊට අදාළ අමාත්‍යාංශයෙන් තොරතුරු ඉල්ලුම් කරන ලෙසත් දැන්වීය. නමුත් 2018 දෙසැම්බර් 18 දින නිකුත් කළ 2103/33 දරණ ගැසට් පත්‍රයට අනුව තරුණ කටයුතු, | පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට තොරතුරු නැත. | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනුරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය යටතට පත් කෙරිණි (2019 මාර්තු 18 දින නිකුත් කළ 2115/1 දරණ ගැසට් පත්‍රයට අනුව වර්තමානයේ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනුරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය ලෙස වෙනස් කෙරිණි) | | |
| යොවුන් සේනාංක හරහා කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සහාය දීම. | සාධනීය | සැළකිය යුතුයි | යොවුන් සේනාංකය |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. | ලද තොරතුරු අනුව, 2018 දෙසැම්බර් 31 වන දින වන විට 2018 සඳහා ඉලක්ක ගත ප්‍රගතියෙන් 78% ක් අත්කරගෙන ඇත. | |
| ස්විට්සර්ලන්ත සහ ජර්මානු රජයන්ගේ අනුග්‍රහය ඇතිව ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය හා සම්බන්ධ කාර්මික විද්‍යාල 5 ක් ඇති කිරීම. | ආවෘත | හෙළිකර නැත | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන හා යෞවන කටයුතු අමාත්‍යාංශය (මීට පෙර තරුණ කටයුතු, ව්‍යාපෘති කළමනාකරණ සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය) |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | මෙම පොරොන්දුවට අදාළ තොරතුරු ලබාගැනීමට වගකිවයුතු රාජ්‍ය ආයතනය වෙත ලබාදුන් දුරකථන ඇමතුම් වලට සහ 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉදිරිපත් කළ තොරතුරු ඉල්ලීමට මෙම අදාළ රාජ්‍ය ආයතනය තොරතුරු ලබා නොදුන් අතර මෙම පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට භාවිත කළ හැකි කිසිදු තොරතුරක් වගකිවයුතු ආයතනයේ වෙබ් අඩවියේ පළකර නැත. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉදිරිපත් කළ තොරතුරු ඉල්ලීමට පිළිතුරු ලෙස, වගකිව යුතු රාජ්‍ය ආයතනය ලිපියක් යොමු කරමින්, 'තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය' යන කටයුතු එම ආයතනය යටතට අයත් නොවන බව දැන්වීය. | පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට තොරතුරු නැත. | |
| අධ්‍යාපන ප්‍රතිසංස්කරණ | සීමිත | සැළකිය යුතුයි | අධ්‍යාපන අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. නමුත් මෙම පොරොන්දුවේ ක්‍රියාකාරකම් වලට අදාළ ප්‍රගතිය එකම ආකෘතියක් භාවිත කරමින් ඉදිරිපත් කර නොතිබීම නිසා මෙහි ප්‍රගතිය ඇගයිය නොහැක. මෙම පොරොන්දුව සඳහා ප්‍රගතිය තීරණය කරන ලද්දේ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 සැප්තැම්බර් 30 දිනට මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් වල ප්‍රගතිය" යන වාර්තාව භාවිතයෙනි. | 2016 අංක 12 තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ වගකිව යුතු ආයතනයෙන් පොරොන්දුව අත්කරගත් ප්‍රගතිය පිළිබඳ විශාල තොරතුරු ප්‍රමාණයක් ලැබුණද, එක් එක් ක්‍රියාකාරකම එහි ඉලක්කයට සාපේක්ෂව අත්කරගත් ප්‍රගතිය ගණනය කළ නොහැක. ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති තොරතුරු අනුව 2018 සැප්තැම්බර් 30 දින වන විට, 2018 සඳහා ඉලක්කගත ප්‍රගතියෙන් 80% ක් අත්කරගෙන ඇත. | |
| ගුරුවරුන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් | සීමිත | හෙළිකර නැත | අධ්‍යාපන අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. නමුත් මෙම පොරොන්දුවේ ක්‍රියාකාරකම්වල ප්‍රගතියට අදාළ තොරතුරු එකම ආකෘතියක් | 2016 අංක 12 තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ වගකිව යුතු ආයතනයෙන් පොරොන්දුව අත්කරගත් ප්‍රගතිය පිළිබඳ විශාල තොරතුරු ප්‍රමාණයක් | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | භාවිත කරමින් ඉදිරිපත් කර නොතිබීම නිසා මෙහි ප්‍රගතිය ඇගයිය නොහැක. | ලැබුණද, එක් එක් ක්‍රියාකාරකම එහි ඉලක්කයට සාපේක්ෂව අත්කරගත් ප්‍රගතිය ගණනය කළ නොහැක. | |
| වයඹ, සබරගමුව සහ මොරටුව විශ්ව විද්‍යාල සඳහා වෛද්‍ය පීඨ ඇති කිරීම. | සීමිත | අර්ධ සම්පූර්ණයි | නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය<br>(මීට පෙර උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය) |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. නමුත් ලද තොරතුරු භාවිතයෙන් මෙහි සැළකිය යුතු ප්‍රතිපාදනයක්, එනම් රු.මි. 900 ක් වෙන්වූ ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය පිහිටවීමට අදාළ ප්‍රගතිය ඇගයිය නොහැක. මෙම පොරොන්දුව සඳහා ප්‍රගතිය තීරණය කරන ලද්දේ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 සැප්තැම්බර් 30 දිනට මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් වල ප්‍රගතිය" යන වාර්තාව භාවිතයෙනි. | 2016 අංක 12 තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ වගකිව යුතු ආයතනයෙන් පොරොන්දුව අත්කරගත් ප්‍රගතිය පිළිබඳ ලද තොරතුරු අනුව, පොරොන්දුවේ එක් කොටසක් (වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය පිහිටුවීම) 55% ක ප්‍රගතියක් අත්කරගෙන ඇත. නමුත් ලද තොරතුරු භාවිතයෙන් මෙහි සැළකිය යුතු ප්‍රතිපාදනයක්, එනම් රු.මි. 900 ක් වෙන්වූ ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය පිහිටුවීමට අදාළ ප්‍රගතිය ඇගයිය නොහැකි බැවින් මෙම පොරොන්දුවේ සමස්ථ ප්‍රගතිය ඇගයිය නොහැක. ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති තොරතුරු අනුව 2018 සැප්තැම්බර් 30 දින වන විට මෙම සංරචකය, 2018 සඳහා ඉලක්කගත ප්‍රගතියෙන් 57% ක් අත්කරගෙන ඇත. එබැවින් සමස්ථ පොරොන්දුවේ ප්‍රගතිය 56% ක් ලෙස ගණනය කර ඇත. මෙහි ප්‍රගතිය ගණනය කර ඇත්තේ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකරකම් වල ප්‍රගතිය එහි ප්‍රතිපාදන සමඟ බර තැබීමෙනි. | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| තාක්ෂණික විෂය ධාරාව ව්‍යාප්ත කිරීම සඳහා නව තාක්ෂණික පීඨ 7 ක් ඇති කිරීම. | සාධනීය | අර්ධ සම්පූර්ණයි | නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය<br>(මීට පෙර උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය) |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු, 2016 අංක 12 තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. | ලද තොරතුරු අනුව, 2018 දෙසැම්බර් 31 වන දින වන විට, 2018 සඳහා ඉලක්ක ගත ප්‍රගතියෙන් 51% ක් අත්කරගෙන ඇත. මෙහි ප්‍රගතිය ගණනය කර ඇත්තේ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකරකම් වල ප්‍රගතිය එහි ප්‍රතිපාදන සමඟ බර තැබීමෙනි. | |
| දියගම ප්‍රදේශයේ ක්‍රීඩා පාසලක් සහ ඇකඩමියක් ස්ථාපිත කිරීම සහ 2020 දකුණු ආසියානු ක්‍රීඩා උළෙල සඳහා ක්‍රීඩා සංකීර්ණයක් පිළියෙළ කිරීම. | සාධනීය | අර්ධ සම්පූර්ණයි | විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශය<br>(මීට පෙර පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය) |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු, විද්‍යුත් තැපැල ඔස්සේ වගකිව යුතු ආයතනයට යොමුකළ තොරතුරු ඉල්ලීමට පිළිතුරු ලෙස ලද ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. | ලද තොරතුරු අනුව, 2018 දෙසැම්බර් 31 වන දින වන විට ඉටුකිරීමට ඉලක්ක කොට තිබූ ක්‍රියාකාරකම් වලින් 50% ක් 2019 වසරට කල් දමා ඇත. එබැවින්, 2018 දෙසැම්බර් 31 වන දිනට අත්කරගෙන ඇති ප්‍රගතිය 50% ලෙස ගණනය කර ඇත. | |
| සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනය නඟා සිටුවීම. | සාධනීය | දුර්වලයි | විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශය |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | | | (මීට පෙර පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය) |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු, විද්‍යුත් තැපැල ඔස්සේ වගකිව යුතු ආයතනයට යොමුකළ තොරතුරු ඉල්ලීමට පිළිතුරු ලෙස ලද ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. | ලද තොරතුරු අනුව, 2018 දෙසැම්බර් 31 වන දින වන විට ඉටුකිරීමට ඉලක්ක කොට තිබූ ක්‍රියාකාරකම් වලින් 90% ක් 2019 වසරට කල් දමා ඇත. එබැවින්, 2018 දෙසැම්බර් 31 වන දිනට අත්කරගෙන ඇති ප්‍රගතිය 10% ක් ලෙස ගණනය කර ඇත. | |
| 2020 වනවිට අඩු ආදායම්ලාභීන් සඳහා නාගරික පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ නිවාස 20,000 ක් ලබාදීම. | විවෘත | සැළකිය යුතුයි | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු වගකිවයුතු රාජ්‍ය ආයතනයේ වෙබ් අඩවිය ඔස්සේ සපයා ඇති ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. මීට අමතරව 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනය වෙත ඉදිරිපත් කළ තොරතුරු ඉල්ලුම්පතකින් සහ විද්‍යුත් තැපැල හරහා කළ ඉල්ලීමක් තුළින් ද තොරතුරු ලබා ගැනිණි. | ලද තොරතුරු අනුව, 2018 දෙසැම්බර් 31 වන දින වන විට, 2018 වසර සඳහා ඉලක්ක ගත ප්‍රගතියෙන් 75% ක් අත්කරගෙන ඇත. මෙහි ප්‍රගතිය ගණනය කර ඇත්තේ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම් වල ප්‍රගතිය එහි ප්‍රතිපාදන සමඟ බර තැබීමෙනි. | |
| උතුරු නැගෙනහිර පළාත්වල නිවාස ඉදිකිරීම. | සීමිත | සම්පූර්ණයි | නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය<br><br>(මීට පෙර නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය) |
| | 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනය වෙත ඉදිරිපත් කළ තොරතුරු ඉල්ලුම්පතට හා ආයතනය වෙත ගොස් තොරතුරු ලබාගැනීමට ගත් උත්සහයට වගකිව යුතු ආයතනය මගින් පිළිතුරු නොලැබුණි. එලෙසම මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ කිසිදු තොරතුරක් වගකිවයුතු රාජ්‍ය ආයතනයේ වෙබ් අඩවිය තුළ පළකර | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති තොරතුරු අනුව 2018 සැප්තැම්බර් 30 දින වන විට, 2018 සඳහා ඉලක්කගත ප්‍රගතියෙන් 87% ක් අත්කරගෙන ඇත. මෙහි ප්‍රගතිය ගණනය කර ඇත්තේ ක්‍රියාකාරී සැලැස්මේ | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | නොතිබිණි. මෙම පොරොන්දුව සඳහා ප්‍රගතිය තීරණය කරන ලද්දේ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 සැප්තැම්බර් 30 දිනට මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් වල ප්‍රගතිය" යන වාර්තාව භාවිතයෙනි | සඳහන් ක්‍රියාකාරකම් වල ප්‍රගතිය එහි ප්‍රතිපාදන සමඟ බර තැබීමෙනි. | |
| වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිතව නිවාස ඉදිකිරීම. | සාධනීය | අර්ධ සම්පූර්ණයි | කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු විද්‍යුත් තැපැල ඔස්සේ වගකිව යුතු ආයතනයට යොමුකළ තොරතුරු ඉල්ලීමට පිළිතුරු ලෙස ලද ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. | ලද තොරතුරු අනුව, 2018 දෙසැම්බර් 31 වන දින වන විට, 2018 සඳහා ඉලක්ක ගත ප්‍රගතියෙන් 51% ක් අත්කරගෙන ඇත. | |
| නිවාස හිමියන්ගේ නිවාස යෝජනා ක්‍රමය සහ ග්‍රාමීය අංශයේ දැනට පවතින නිවාස වැඩිදියුණු කිරීම සඳහා සහාය දීම. | ආවෘත | හෙළිකර නැත | නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය<br>(මීට පෙර නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය) |
| | 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනය වෙත ඉදිරිපත් කළ තොරතුරු ඉල්ලුම්පතට හා ආයතනය වෙත ගොස් තොරතුරු ලබාගැනීමට ගත් උත්සහයට වගකිව යුතු ආයතනය මගින් පිළිතුරු නොලැබුණි. එලෙසම මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ කිසිදු තොරතුරක් වගකිවයුතු රාජ්‍ය ආයතනයේ වෙබ් අඩවිය තුළ පළකර නොතිබිණි. | පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට තොරතුරු නැත. | |
| නාගරික පුනර්ජනනීය ව්‍යාපෘතිය | විවෘත | සැළකිය යුතුයි | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු වගකිවයුතු රාජ්‍ය ආයතනයේ වෙබ් අඩවිය ඔස්සේ සපයා ඇති ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. මීට අමතරව 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනය වෙත ඉදිරිපත් කළ තොරතුරු ඉල්ලුම්පතකින් සහ විද්‍යුත් තැපැල හරහා කළ ඉල්ලීමක් මතද තොරතුරු ලබා ගැනිණි. | ලද තොරතුරු අනුව, 2018 දෙසැම්බර් 31 වන දින වන විට, 2018 සඳහා ඉලක්ක ගත ප්‍රගතියෙන් 77% අත්කරගෙන ඇත. මෙහි ප්‍රගතිය ගණනය කර ඇත්තේ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය එහි ප්‍රතිපාදන සමඟ බර තැබීමෙනි. මෙහි උප ක්‍රියාකාරකම් වල ප්‍රගතියට අදාළ ප්‍රතිපාදන දී නොමැති අවස්ථාවන්හීදී, මුළු ක්‍රියාකාරකමේ ප්‍රගතියේ සාමාන්‍යය එම ක්‍රියාකාරකමේ මුළු ප්‍රතිපාදනයේ බර තැබීමක් ලෙස ගණනය කර ඇත. | |
| නගර සංවර්ධනය සහ මහනුවර, අනුරාධපුරය, ගාල්ල, යාපනය යන දිස්ත්‍රික්කයන්හි උපාය මාර්ගික නගර සංවර්ධන වැඩසටහන | විවෘත | සම්පූර්ණයි | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු වගකිවයුතු රාජ්‍ය ආයතනයේ වෙබ් අඩවිය ඔස්සේ සපයා ඇති ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. මීට අමතරව 2016 අංක 12 තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනය වෙත ඉදිරිපත් කළ තොරතුරු ඉල්ලුම්පතකින් සහ විද්‍යුත් තැපැල හරහා කළ ඉල්ලීමක් මතද තොරතුරු ලබා ගැනිණි. | ලද තොරතුරු අනුව, 2018 දෙසැම්බර් 31 වන දින වන විට, 2018 සඳහා ඉලක්ක ගත ප්‍රගතියෙන් 83% ක් අත්කරගෙන ඇත. මෙහි ප්‍රගතිය ගණනය කර ඇත්තේ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම් වල ප්‍රගතිය එහි ප්‍රතිපාදන සමඟ බර තැබීමෙනි. | |
| කල්මුණේ සහ සමන්තුරෙයි නගර සංවර්ධනය සඳහා වන ප්‍රධාන සැලසුම ක්‍රියාත්මක කිරීම සහ පසුගාමී කලාප වල | ආවෘත | හෙළිකර නැත | නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය<br>(මීට පෙර නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශය) |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| නගර සංවර්ධනය කිරීම. | 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනය වෙත ඉදිරිපත් කළ තොරතුරු ඉල්ලුම්පතට හා ආයතනය වෙත දුන් දුරකථන ඇමතුම් වලට පිළිතුරු නොලැබුණි. එලෙසම මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ කිසිදු තොරතුරක් වගකිවයුතු රාජ්‍ය ආයතනයේ වෙබ් අඩවිය තුළ පළකර නොතිබිණි. | පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට තොරතුරු නැත. | |
| මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය. | සීමිත | සැළකිය යුතුයි | මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය<br>(මීට පෙර මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය) |
| | මෙම පොරොන්දුවට අදාළ තොරතුරු ලබාගැනීමට වගකිවයුතු රාජ්‍ය ආයතනය වෙත ලබාදුන් දුරකථන ඇමතුම් වලට සහ 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉදිරිපත් කළ තොරතුරු ඉල්ලීමට මෙම අදාළ රාජ්‍ය ආයතනය තොරතුරු ලබා නොදුනි. එමෙන්ම, මෙම පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට භාවිත කළ හැකි සමහරක් තොරතුරු වගකිවයුතු ආයතනයේ වෙබ් අඩවියේ සහ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 නොවැම්බර් 30 දිනට ප්‍රමුඛතා ව්‍යාපෘති වල ප්‍රගතිය" යන වාර්තාව තුළ අන්තර්ගත විය. නමුත් පොරොන්දුවේ සමස්ථ ප්‍රගතිය ඇගයීමට තරම් ප්‍රමාණවත් තොරතුරු මෙම කිසිදු මූලාශ්‍රයක නැත. | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති තොරතුරු අනුව 2018 සැප්තැම්බර් 30 දින වන විට මෙම ව්‍යාපෘතියේ එක් එක් කොටසට අදාළ ප්‍රගතිය තීරණය කළ හැක. මෙහි පළමු කොටසේ සංරචක දෙක 2018 වසරේ ඉලක්කයන්ට සාපේක්ෂව (75% සහ 19%) පිළිවෙළින් 84% සහ 32%ක ප්‍රගතියක් අත්කරගෙන ඇත. දෙවන කොටසේ සංරචක දෙක 2018 වසරේ ඉලක්කයන්ට සාපේක්ෂව (100% සහ 45%) පිළිවෙළින් 83% සහ 96% ක ප්‍රගතියක් අත්කරගෙන ඇත. ව්‍යාපෘතියේ තෙවන කොටසේ භූමිය අත්පත් කරගැනීම 2018 වසරේ ඉලක්කයන්ට සාපේක්ෂව (100%) 80% ක ප්‍රගතියක් අත්කරගෙන ඇත. එමෙන්ම හතරවන කොටස 2018 වසරේ ඉලක්කයන්ට සාපේක්ෂව (75%) 91% ක | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | | ප්‍රගතියක් අත්කරගෙන ඇත. එබැවින් මෙම පොරොන්දුව 2018 වසරේදී සැළකිය යුතු ප්‍රගතියක් අත්කරගෙන ඇත. | |
| ග්‍රාමීය මාර්ග ජාලය වැඩිදියුණු කිරීම. | ආවෘත | හෙළිකර නැත | මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය<br>(මීට පෙර මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය) |
| | මෙම පොරොන්දුවට අදාළ තොරතුරු ලබාගැනීමට වගකිවයුතු රාජ්‍ය ආයතනය වෙත ලබාදුන් දුරකථන ඇමතුම් වලට සහ 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉදිරිපත් කළ තොරතුරු ඉල්ලීමට මෙම අදාළ රාජ්‍ය ආයතනය තොරතුරු ලබා නොදුනි. එලෙසම මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ කිසිදු තොරතුරක් වගකිවයුතු රාජ්‍ය ආයතනයේ වෙබ් අඩවිය තුළ පළකර නොතිබිණි. | පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට තොරතුරු නැත. | |
| ගංවතුර හා නායයෑම් හේතුවෙන් අපදාවට පත් වූ මාර්ග පුනරුත්ථාපනය කිරීම. | සාධනීය | සම්පූර්ණයි | රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය<br>(මීට පෙර වාරිමාර්ග හා ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය) |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. | ලද තොරතුරු අනුව, 2018 දෙසැම්බර් 31 වන දින වන විට, 2018 වසර සඳහා ඉලක්ක ගත ප්‍රගතියෙන් 82% ක් අත්කරගෙන ඇත. මෙහි ප්‍රගතිය ගණනය කර ඇත්තේ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම් වල ප්‍රගතිය | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | | එහි මුළු ඇස්තමේන්තුගත පිරිවැය සමඟ බර තැබීමෙනි. මෙහිදී ප්‍රගතිය එහි ප්‍රතිපාදන සමඟ බර තැබීමෙන් ගණනය කළ නොහැක්කේ 2018 වසරට පෙර ආරම්භ කළ ක්‍රියාකාරකම් හා 2018 වසර සඳහා ප්‍රතිපාදන වෙන් කළ ක්‍රියාකාරකම් වල පවත්නා වෙනස්කම් හේතුවෙනි. | |
| ලංකා බැංකුව සඳහා ප්‍රාග්ධන පහසුකම් සැපයීම. | විවෘත | සම්පූර්ණයි | මුදල් අමාත්‍යාංශය<br>(මීට පෙර මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය) |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු ලංකා බැංකු වෙබ් අඩවිය මගින් පළකළ ලිපියක් මගින් ලබාගෙන ඇත. එලෙසම වගකිවයුතු රාජ්‍ය ආයතනය වෙත යොමුකළ ඉල්ලීමකට පිළිතුරු ලෙස විද්‍යුත් තැපැල හරහා තොරතුරු ලබා ගැනිණි. | ලද තොරතුරු අනුව 2018 දෙසැම්බර් 31 වන දින වන විට 2018 වසර සඳහා ඉලක්ක ගත ප්‍රගතියෙන් 100% අත්කරගෙන ඇත. | |
| තාක්ෂණය හා ඩිජිටල්කරණය තුළින් තොරතුරු සන්නිවේදන තාක්ෂණ ආයතනයේ සේවා සැපයීම වැඩිදියුණු කිරීම (පුනරාවර්තන වියදම රු. මිලියන 500) | සාධනීය | සැළකිය යුතුයි | විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශය<br>(මීට පෙර විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යාංශය) |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු විද්‍යුත් තැපැල ඔස්සේ අදාළ වගකිවයුතු ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. | ලද තොරතුරු අනුව, 2018 දෙසැම්බර් 31 වන දින වන විට, 2018 වසර සඳහා ඉලක්ක ගත ප්‍රගතියෙන් 77% ක් අත්කරගෙන ඇත. මෙහි ප්‍රගතිය ගණනය කර ඇත්තේ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකරකම් වල ප්‍රගතිය එහි ප්‍රතිපාදන සමඟ බර තැබීමෙනි. ක්‍රියාකාරී සැලැස්මේ ඇති එක් ක්‍රියාකාරකමක් වෙනුවෙන්, එනම් අධ්‍යාපනය තුළ ඇති තොරතුරු සන්නිවේදන තාක්ෂණය (ICT) යන | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | | ක්‍රියාකාරකම සඳහා භෞතික ඉලක්ක මෙන්ම, ප්‍රගති වාර්තාව තුළ ප්‍රගතියද සටහන් කර නොමැත. එම නිසා මෙය ගණනය කිරීම වලදී ඉවත් කර ඇත. | |
| සංහිඳියාව ශක්තිමත් කරමින් ආර්ථිකය සවිබල ගැන්වීම හා සමාජ යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ අවධානය යොමු කිරීම සහ උතුරු හා නැගෙනහිර පළාත්වල වෙනස් හැකියාවන් සහිත කාන්තාවන්ගේ අවශ්‍යතා සපුරාලීමට විශේෂ වැඩසටහන්. | සීමිත | හෙළිකර නැත | ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය<br>(මීට පෙර ජාතික ඒකාබද්ධතා, ප්‍රතිසන්ධාන හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය) |
| | මෙම පොරොන්දුවට අදාළ තොරතුරු ලබාගැනීමට වගකිවයුතු රාජ්‍ය ආයතනය වෙත ලබාදුන් දුරකථන ඇමතුම් වලට මෙම ආයතනය තොරතුරු ලබා නොදුනි. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉදිරිපත් කළ තොරතුරු ඉල්ලීමට පිළිතුරු ලෙස ක්‍රියාකාරී සැලැස්ම ලබා දුනි. එලෙසම මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ කිසිදු තොරතුරක් වගකිවයුතු රාජ්‍ය ආයතනයේ වෙබ් අඩවිය තුළ පළකර නොතිබිණි. | පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට තොරතුරු නැත. | |
| සංහිඳියාව ශක්තිමත් කරමින් ආර්ථිකය සවිබල ගැන්වීම හා සමාජ යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ අවධානය යොමු කිරීම සහ උතුරු | සාධනීය | සම්පූර්ණයි | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන හා යෞවන කටයුතු අමාත්‍යාංශය |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| හා නැගෙනහිර පළාත්වල වෙනස් හැකියාවන් සහිත කාන්තාවන්ගේ අවශ්‍යතා සපුරාලීමට විශේෂ වැඩසටහන්. | | | (මීට පෙර නැවත පදිංචි කිරීම, පුනුරුත්ථාපන, උතුරු සංවර්ධන හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය) |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු විද්‍යුත් තැපැල ඔස්සේ වගකිව යුතු ආයතනයට යොමුකළ තොරතුරු ඉල්ලීමට පිළිතුරු ලෙස ලද ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. | ලද තොරතුරු අනුව, 2018 දෙසැම්බර් 31 වන දින වන විට 2018 වසර සඳහා ඉලක්ක ගත ප්‍රගතියෙන් 100% ක් අත්කරගෙන ඇත. | |
| ණය සමූපකාර සමිති හරහා උතුරු හා උතුරුමැද පළාත්වල ණයගැති ජනයාට සහය ලබාදීම. | සාධනීය | සම්පූර්ණයි | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන හා යෞවන කටයුතු අමාත්‍යාංශය<br>(මීට පෙර නැවත පදිංචි කිරීම, පුනුරුත්ථාපන, උතුරු සංවර්ධන හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය) |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු විද්‍යුත් තැපැල ඔස්සේ වගකිව යුතු ආයතනයට යොමුකළ තොරතුරු ඉල්ලීමට පිළිතුරු ලෙස ලද ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. | ලද තොරතුරු අනුව, 2018 දෙසැම්බර් 31 වන දින වන විට 2018 වසර සඳහා ඉලක්ක ගත ප්‍රගතියෙන් 100% ක් අත්කරගෙන ඇත. | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| නිෂ්පාදන සමූපකාර හරහා උතුරු පළාතේ තෝරාගත් කුඩා කර්මාන්ත සඳහා පහසුකම් සැපයීම. | සාධනීය | සම්පූර්ණයි | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන හා යෞවන කටයුතු අමාත්‍යාංශය<br>(මීට පෙර නැවත පදිංචි කිරීම, පුනුරුත්ථාපන, උතුරු සංවර්ධන හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය) |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු විද්‍යුත් තැපැල ඔස්සේ වගකිව යුතු ආයතනයට යොමුකළ තොරතුරු ඉල්ලීමට පිළිතුරු ලෙස ලද ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. | ලද තොරතුරු අනුව, 2018 දෙසැම්බර් 31 වන දින වන විට, 2018 වසර සඳහා ඉලක්ක ගත ප්‍රගතියෙන් 98% ක් අත්කරගෙන ඇත. | |
| මුස්ලිම් අවතැන් වූවන් නැවත පදිංචි කිරීම - නිවාස සහ යටිතල පහසුකම් සැපයීම (රුපියල් මිලියන 750 ක් දැනටමත් වෙන්කර ඇත.) | සාධනීය | සැළකිය යුතුයි | |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු 2016 අංක 12 තොරතුරු දැනගැනීමේ පනත යටතේ සහ විද්‍යුත් තැපැල මගින් කළ ඉල්ලීම අනුව අදාළ ආයතනයෙන් ලබා ගත් ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. | ලද තොරතුරු අනුව 2018 දෙසැම්බර් 31 වන දින වන විට 2018 වසර සඳහා ඉලක්ක ගත ප්‍රගතියෙන් 72% ක් අත්කරගෙන ඇත. මෙහි ප්‍රගතිය ගණනය කර ඇත්තේ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්වල ප්‍රගතිය එහි ප්‍රතිපාදන සමඟ බර තැබීමෙනි. "මන්නාරම නගර ප්‍රදේශය සාප්පු සංකීර්ණයක් සහ බස් නැවතුම්පොළක් ඉදිකරමින් පුනරුත්ථාපනය කිරීම හා සිලාවතුර ප්‍රදේශයේ මුස්ලිම් ග්‍රාම නිලධාරී වසම් වල නගර සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම" යන ක්‍රියාකාරකම 50% ක ප්‍රගතියක් අත්කරගෙන ඇති බව උපකල්පනය කර ඇත. මෙයට හේතුව මෙම වේදිකාව | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | | තුළින් ඉදිරිපත් කළ අර්ධ වාර්ෂික ඇගයීමට අනුව, ඒ වන විට තිබූ ප්‍රගති වාර්තාවේ මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් අනුමැතිය හිමි වී වැඩ ආරම්භ කළ බව සඳහන් වීමය. එලෙසම "පාසල්, රෝහල් හා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම" යන ක්‍රියාකාරකම 100% ක ප්‍රගතියක් අත්කරගෙන ඇතැයි උපකල්පනය කෙරේ. ඊට හේතුව මේ සඳහා වෙන්කළ සමස්ථ ප්‍රතිපාදනය උපයෝජනය කර තිබීමය. | |
| අතුරුදහන්වූ පුද්ගලයින් සඳහා කාර්යාලයක් පිහිටුවීම සඳහා සහයවීම (පුනරාවර්තන වියදම රුපියල් මිලියන 650) | සීමිත | හෙළිකර නැත | ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය<br>(මීට පෙර ජාතික ඒකාබද්ධතා, ප්‍රතිසන්ධාන හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය) |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු 2016 අංක 12 තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ලේඛන මගින් ලබා ගැනිණි. නමුත් ලද තොරතුරු වල පොරොන්දුවට අදාළ ක්‍රියාකාරකම්, ඊට අදාළ ඉලක්ක සහ එහි ප්‍රගතිය අනතර්ගත නොවීය. එබැවින් ප්‍රගතිය ඇගයිය නොහැක. | 2016 අංක 16 තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ වගකිව යුතු ආයතනයෙන් පොරොන්දුව අත්කරගත් ප්‍රගතිය පිළිබඳ විශාල තොරතුරු ප්‍රමාණයක් ලැබුණද, එක් එක් ක්‍රියාකාරකම එහි ඉලක්කයට සාපේක්ෂව අත්කරගත් ප්‍රගතිය ගණනය කළ නොහැක. | |

**වගකීම්හරණය**

මෙම වෙබ් අඩවියෙහි අන්තර්ගත වන තොරතුරු ලබා ගනු ලබන්නේ රජයේ වාර්තා, නිල ප්‍රකාශන, ප්‍රසිද්ධ වාර්තා, සහ තොරතුරු දැනගැනීමේ පණත යටතේ ලබාගත් තොරතුරු යනාදිය වෙතිනි. තවද, මෙම වෙබ් අඩවියේ පළ කරනු ලබන තොරතුරු කිසිවක් කිසිදු ආකාරයකින් වෙරිටේ රිසර්ච් ආයතනයේ හෝ එහි සාමාජිකයන්ගේ පෞද්ගලික අදහස් යැයි අර්ථකථනය කළ නොහැක. එමෙන්ම මෙම වෙබ් අඩවියේ ඇති යම් තොරතුරක ප්‍රතිඵලයක් ලෙසින් කිසියම් කෙනෙකු අප්‍රසිද්ධියට හෝ අපකීර්තියට පත්වුවහොත් එයට වෙරිටේ රිසර්ච් මොනයම් ආකාරයකින් හෝ වග කියනු නොලැබේ.

අපගේ වෙබ් අඩවිය සඳහා හැකිතාක් විශ්වාසදායී තොරතුරු ලබා ගැනීමට උපරිම ලෙස ක්‍රියාකළද, මෙම රැස් කරගත් තොරතුරුවල තිබිය හැකි අක්‍රමිකතා හෝ අතපසුවීම් නිසා එම තොරතුරු භාවිතයෙන් උද්ගත විය හැකි ගැටලුවලට වෙරිටේ රිසර්ච් හෝ BudgetPromises.org වෙබ් අඩිවයේ ක්‍රියාකාරීන් වග කියනු නොලැබේ.

එමෙන්ම වෙරිටේ රිසර්ච් ආයතනයේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව අප විසින් ප්‍රකාශයට පත් කරනු ලබන තොරතුරු වෙනස් කිරීමට, අන් තැනෙක ප්‍රකාශ කිරීමට, සම්ප්‍රේෂණය කිරීමට, හුවමාරු කිරීමට, විකිණීමට, ප්‍රතිනිර්මාණය කිරීමට, බෙදා හැරීමට, නැවත පළ කිරීමට, අභිවහනය කිරීමට, ප්‍රදර්ශනය කිරීමට හෝ කිසිදු වාණිජමය අරමුණකින් අපයෝජනය කිරීමට කිසිවෙකුට කිසිසේත් හිමිකම් නැත. එමෙන්ම වෙරිටේ රිසර්ච් ආයතනයේ අනුමැතිය සහිතව හෝ රහිතව BudgetPromises.org හි තොරතුරු භාවිතා කිරීමෙන් ඇති විය හැකි ප්‍රතිවිපාකවලටද අපි වග නොකියමු.

වෙරිටේ රිසර්ච් ආයතනය කිසිදු දේශපාලන පක්ෂයක් සහ/හෝ දේශපාලන අරමුණු ඇති සංවිධානයකට සහය හෝ අනුමැතිය නොදක්වන අතර එවැනි කිසිවක් වෙනුවෙන් පෙනී සිටීම හෝ නියෝජනය කිරීම ද නොකරයි.

මෙම වෙබ් අඩවියේ සඳහන් වන තොරතුරු මහජනයා අතර දැනුවත්භාවය නංවාලනු වස් කිසිදු අයකිරීමකින් තොරව සපයනු ලැබේ. එමෙන්ම වෙරිටේ රිසර්ච් ආයතනය හෝ BudgetPromises.org කණ්ඩායම කිසිදු පාර්ශවයක් සමඟ මෙම වෙබ් අඩවියේ සඳහන් තොරතුරු ලබාදීමට කිසිදු ගිවිසුමකට හෝ අවබෝධතාවකට එළඹ නැත.

මෙම වෙබ් අඩවියට ඇතුලත් වන්නේ budgetpromises.org විසින් විශ්ලේෂණය කර සම්පාදනය කරන ලද ස්වාධීන විශ්ලේෂණයන්හි ප්‍රතිඵල වන අතර එමඟින් දත්ත වල පවතින ප්‍රවණතාවයන් සහ හැසිරීම ඉදිරිපත් කර ඇත. එම තොරතුරුවලින් කිසිවක්, කිසිවකු විසින් ප්‍රතිඋත්පාදනය කරන්නට අදහස් කරන්නේනම් වෙරිටේ රිසර්ච් ආයතනයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.